පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

කමිටුව විසින් හඳුනාගෙන ඇති දුර්වලතා	දුර්වලතාවය නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
<u>පළමු කොටස</u> 1. අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙම කාර්යාලයේ සීමිත කාර්යමණ්ඩලයක් සිටින බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් නිළධාරීන් නොමැත.
2. අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් අවදානම් ලේඛනයක්ද පවත්වාගෙන යනු නොලැබේ.
3. මු.රෙ.134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් අභ්‍යන්තර විගණන වැඩසටහනක්ද පිළියෙල නොකරයි.
4. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපවත්වයි.
<u>දෙවන කොටස</u> 1. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්නෙමු.
2. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ. වියාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	විගණකාධිපති වාර්තාව අනුව, ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, තත්වාගණනය කළ මතයක් ලෙස සඳහන් වේ. එහි සඳහන් පරිදි, එම වාර්තාවේ 1.6 ඡේදයේ කරුණු වලින් වන බලපෑම හැර, සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව දක්වා ඇත. එහි, (අ) ලිඛිත දෝෂය- නැවත සිදු නොවීමට කටයුතු කරමු. (ආ) අත්තිකරම් බී ගිණුමේ වෙනස - නිරවුල් කර ගැනීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.
3. සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	දැනට කාර්යසාධන ගිවිසුම් සකස්කර නොමැති අතර ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන්නෙමු.
4. ආයතනය තම විෂයය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ළඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර	ආයතනයේ කාර්යයභාර්යයේ ස්වභාවය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමු.

නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	
5. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කෝවිඩ් වසංගතය හේතුවෙන් වර්ෂයේ මුල් කාර්තුවලදී නිළධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීමට නොහැකි විය.
6. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනයේ ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක හඳුනාගෙන ගැනීමට ඉදිරියේදී කටයුතු කරන්නෙමු.

කේ.බී.කේ. හිරිඹුරේගම

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)